# අවදානම් සාධක



ඔබට හෝ ඔබේ සහකරුවාට, ලිංගික සහකරුවන් කිහිප දෙනෙක් සිටීම



අඩු වයසින් ලිංගික ක්‍රියාකාරකම් ආරම්භ කිරීම



ප්‍රතිශක්තිකරණය දුර්වල වීම

- HIV-AIDS වෛරසය ආසාදනය වීම
- ක්ෂය රෝගය වැළඳීම
- දිගු කාලීන නිදන්ගත රෝග පැවතීම



දුම්බීම



පෝෂණ දුර්වලතා



පෞද්ගලික සනීපාරක්ෂාව අඩු වීම

ඉහත සාධක එකක් හෝ ඔබට ඇත්නම්,

**ගැබ්ගෙල පිළිකාවට ගොදුරු වීමට වැඩි අවදානමක් !!**

# රෝග ලක්ෂණ

- මාසික ශුද්ධවීම් දෙකක් අතර ඇතිවන ලේ පිටවීමක්
- ලිංගික එක්වීමකදී ලේ පිටවීමක් සිදුවීම හෝ වේදනාවක් ඇතිවීම
- මාසික ශුද්ධිය නතර වීමෙන් පසු ඇතිවන ලේ පිටවීම
- යෝනි මාර්ගයෙන් දුගඳ ශ්‍රාවයක් පිටවීම

ඔබට ඉහත රෝග ලක්ෂණ එකක් හෝ ඇත්නම්, ඉක්මන් ප්‍රතිකාර සඳහා ළඟම රෝහලට හෝ සුදුසුකම්ලත් වෛද්‍යවරයෙකු වෙත යොමුවන්න




ජාතික පිළිකා මර්දන වැඩසටහන
මහජන සෞඛ්‍ය සංකීර්ණය
555/5, ඇල්විටිගල මාවත, කොළඹ 5
විමසීම් - 011-3159227
www.nccp.health.gov.lk




# ගැබ්ගෙල පිළිකාව



- වළක්වාගත හැක
- ප්‍රතිකාර කළ හැක
- පරාජය කළ හැක

**ජාතික පිළිකා මර්දන වැඩසටහන**

සෞඛ්‍ය අමාත්‍යාංශය

## වළක්වා ගත හැක

# කාන්තාවන් අතර සුලබ පිළිකාවකි

ප්‍රධානතම හේතුව මානව පැපිලෝමා වයිරසයයි (Human Papilloma Virus - HPV)

### HPV එන්නත්කරණය මගින් ගැබ්ගෙල පිළිකාව වළක්වාගත හැක.

පාසල් ප්‍රතිශක්තිකරණ වැඩසටහන හරහා, වයස අවුරුදු 10 - 11 අතර ගැහැණු දරුවන්ට ලබා දෙන මෙම එන්නත අනිවාර්යයෙන්ම

## ඔබේ දරුවාටත්

ලබා ගන්න



## වළක්වා ගැනීමට

- **HPV** එන්නත්කරණය
- විශ්වාසවන්ත එක් ලිංගික සහකරුවෙක් පමණක් ඇසුරු කිරීම
- ආරක්ෂිත ලිංගික ක්‍රියාකාරකම්වල යෙදීම
- දුම්බීමෙන් වැළකීම
- සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවකට යොමුවීම




## කලින් හඳුනා ගැනීමෙන් සුව කළ හැක

### කලින් හඳුනා ගැනීමේ පරීක්ෂණ

- පැප් පරීක්ෂාව
- **HPV DNA** පරීක්ෂාව

ඔබත් වයස අවුරුදු 35 හෝ 45 කාන්තාවක් නම් ඔබගේ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය මගින් පවත්වන **සුවනාරී සායනයකින් පැප් පරීක්ෂාව** සිදු කරගන්න



## මෙම පරීක්ෂණ සිදුකරන වෙනත් ස්ථාන

- පිළිකා කලින් හඳුනා ගැනීමේ මධ්‍යස්ථාන
- නාරි සහ ප්‍රසව සායන